# පිටබැද්දර ප්‍රාදේශීය සභාව
# මාතර දිස්ත්‍රික්කය

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 01 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 ජුලි 19 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 ජනවාරි 31 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව පිටබැද්දර ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට පිටබැද්දර ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම් ලේඛණයේ සඳහන් රු.420,000 ක් වටිනා ඉඩම් කොටස් දෙකක පිරිවැය හා වටිනාකම සඳහන් නොවූ තවත් ඉඩම් කොටස් 2 ක කුඹුරක් හා ගොඩනැගිලි 2 ක වටිනාකම 2012 දෙසැම්බර් 31 දිනට ගිණුම් වල දක්වා නොතිබුණි.

(ආ) සභාවේ ප්‍රධාන කාර්යාලයීය ගොඩනැගිල්ල සඳහා පැතිබැම්මක් ඉදිකර තිබූ අතර ඒ සඳහා මාතර දිස්ත්‍රික් ඉංජිනේරු විසින් 2010 අප්‍රේල් 22 දින රු.3,290,305 ක කළ වැඩ වටිනාකම සහතික කර තිබුණද එකී වියදම ප්‍රාග්ධනිත වී නොතිබුණි.

(ඇ) 2012 දෙසැම්බර් 18 දින රු..3,732,493 ක් ගෙවා මිළදීගෙන තිබුණ මාර්ග තලනයේ වටිනාකම සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඈ) ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමේ හා ස්ථාවර වත්කම් ගිණුමේ ශේෂයන් සමාන විය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ අවසානයට ගිණුම් දෙක අතර රු.3,500,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඉ) මුද්දර ගාස්තු පාලන ගිණුම අනුව 2012 ජනවාරි 01 දිනට ඉදිරියට ගෙන ආ හිග ශේෂය රු.979,163 ක් වුවද, 2012 වර්ෂය තුලදී ඉකුත් වර්ෂ සඳහා රු.1,651,835 ක මුදලක් ලැබී තිබුණි. මේ අනුව පෙර වර්ෂය වෙනුවෙන් ලැබී තිබූ රු.672,672 ක ඌන වෙන් කිරීම සඳහා අදාල ගිණුම් ගැලපුම් නොකොට ප්‍රවර්ථන වර්ෂයේ ආදායමට ගෙන තිබුණි.

(ඊ) මුද්දර ගාස්තු ආදායම් ලේඛණය අනුව සමාලෝචිත වර්ෂයට අදාල හිග මුදල රු.2,660,257 ක් විය. ඒ සඳහා ජර්නල් සටහන් අංක 54 මගින් වෙනත් ආදායම් 1-60 අය ශීර්ෂයට රු.3,667,543 ක මුදලක් බැර කර තිබුණෙන් වෙනස රු.1,007,286 ක් විය.

(උ) සමාලෝචිත වර්ෂයේදී කරන ලද රු. 164,840 ක් වූ අයහාර වියදම් ප්‍රාග්ධන වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඌ) සභාවේ මන්ත්‍රීවරුන්ගේ සභික දීමනා සඳහා 2012 වර්ෂයේදී රු. 623,810 ක මුදලක් වැයකර තිබුණද, එකී දීමනාවෙන් යතුරුපැදි ණයවාරික මුදල වූ රු.372,140 ක මුදල අඩුකරගෙන වර්ෂය තුල ගෙවන ලද ශුද්ධ මුදල වූ රු.251,670 ක මුදල පමණක් වැටුප් වැය විෂයට හර කර තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේදී සභාවේ සභිකයින් 10 දෙනෙකු වෙනුවෙන් යතුරුපැදි ණය ලෙසට අයකර ගෙන තිබුණු රු.372,140 ක මුදල ආදායමක් වුවද එය ගිණුම් ගතවී නොතිබුණි.

(ඒ) වර්ෂය තුලදී රු. 2,547,509 කට මිළදී ගෙන තිබුණු සැපයුම් හා උපකරණ නිකුත් කිරීමේදී අදාල එක් එක් වැය විෂයයන්ට නිකුත් කිරීම් පත්‍රිකා මගින් හර කිරීම සිදු නොකොට ආරම්භක තොගයට ගැනුම් එකතු කොට අවසන් තොග අඩුකල විට ලැබෙන වටිනාකම වර්ෂයේ වියදම ලෙසට ආදායම් හා වියදම් ගිණුමට හර කර තිබුණි.

### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 07 කට අදාලව පාලන ගිණුම් අනුව වටිනාකම රු.12,512,106 වූ අතර උපයෝගී ලේඛණ අනුව වටිනාකම රු.12,606,049 ක් වූයෙන් වෙනස රු. 93,938 ක් විය.

### 1.3.3 නිරවුල් නොකල ගිණුම්

සමාලෝචිත වර්ෂයේදී ගිණුම් විෂයයන් 05 කට අදාලව රු.240,145 ක් වටිනා හර ශේෂයන් හා රු. 1,934,630 ක් වූ බැර ශේෂයන් නිරවුල් කර නොතිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම නිසා එකතුව රු.35,540,560 ක් වූ සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරිමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන අනුව සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,404,174 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 7,341,737 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත<br>රු. '000 | තථ්‍ය<br>රු. '000 | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය<br>රු. '000 |
|---|---|---|---|---|
| (i) | වරිපනම් හා බදු | 606 | 660 | 1,380 |
| (ii) | බදු කුලී | 3,770 | 3,093 | 1,070 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 280 | 305 | 70 |
| (iv) | වෙනත් ආදායම් | 13,910 | 17,813 | 52,481 |

2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 672,338 |
| (ii) | මුද්දර ගාස්තු | 2,994,872 |

2.3 නීති, රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම

විගණනයේදි නිරික්ෂණය වු අනුකූල නොවීම් පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත | සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ සඳහා ලැබිය යුතු රු.550,999 ක් වූ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති | |
| | රීති 218 | සභාව සතු සියළු ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක් හෝ පරික්ෂා කිරිමට සභාපතිවරයා විසින් කටයුතු කළයුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි. |

2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

2005 මාර්තු 31 දිනැති අංක 08/2005 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 11.5 ඡේදය අනුව දේපල ණය සඳහා බැංකු පොලී අනුපාතය හා නිලධාරීන්ගෙන් අයකරනු ලබන සියයට 4 ක පොලී අනුපාතය අතර වෙනස රජය මගින් ප්‍රතිපූර්ණය කළ යුතුය. එසේ වුවද ඉකුත් වර්ෂ හා සමාලොචිත වර්ෂය සඳහා සභා අරමුදලින් ගෙවන ලද රු.202,723 ක මුදලක් 2012 දෙසැම්බර් 31 දිනටද ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

2.5 අවිධිමත් ගනුදෙනු

(අ) දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ 2008 ඔක්තෝබර් 23 දිනැති අංක දපපා/ආ/5/6 දරන ලිපියෙන් සභාවේ මන්ත්‍රීවරුන් වෙත ජංගම දුරකථන සඳහා කාඩ්පත් ලබාදීමේදී එකී මන්ත්‍රීවරුන් වෙත දුරකථන සම්බන්ධතාවයන් ලබාගෙන තිබෙන බවට තහවුරුවක් කරගෙන මාසිකව රු.1,000 ක කාඩ්පත් සභාව විසින් මිලදී ගෙන ලබාදිය යුතු වුවද එකී නියමය අනුගමනය කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරුන්ට පමණක් අදාල කාඩ්පත් ලබාදෙන ලෙස උක්ත ලිපියේ සඳහන්ව තිබුණ ද එම විධිවිධානයන්ට පටහැනිව ප්‍රාදේශිය සභාවේ ලේකම්වරයාට 2012 වර්ෂයේදි රු.6,000 ක් වටිනා කාඩ්පත් මිලදි ගෙන ලබා දී තිබුණි.

(ඇ) 2013 අප්‍රේල් 22 දිනැති අංක 1807/2 ගැසට් නිවේදනයේ 2 වන ඡේදය පරිදි සභාපතිවරයෙකුට උප සභාපතිවරයෙකුට හෝ සභිකයෙකුට මහජන නියෝජිතයෙකු වශයෙන් පැවරී ඇති කාර්යයන්/සභාව මගින් පවරන ලද කාර්යයන් සඳහා ගමන් කිරීමේදි දරනු ලබන වියදම් ප්‍රතිපූරණය කිරිමක් වශයෙන් මසකට රු. 3,000 ක උපරිමයකට යටත්ව ගමන් වියදම් දීමනාවක් ගෙවිය යුතු බව දන්වා ඇතත් කිසිදු කාර්ය පැවරීමකින් තොරව සභාපති ඇතුළු මන්ත්‍රීවරුන් 10 දෙනෙකු වෙත සමාලෝචිත වර්ෂය සඳහා රු.360,000 මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

2.6 අභ්‍යන්තර විගණනය

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක වී නොතිබු අතර විගණනය හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ගබඩා පාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) ආදායම් පරිපාලනය

ඇමුණුම 01

2012 දෙසැම්බර් 31 දිනට ඉඩම් හා ගොඩනැගිලි පිරිවැයට ඇතුලත්ව නොමැති ඉඩම් හා ගොඩනැගිලි

| විස්තරය | පිරිවැය වටිනාකම රු. | මිලදී ගත් දින |
|---|---|---|
| මොරවක කොට්ටපිටිය ඉඩම (ක්‍රීඩා භූමිය) | සඳහන්ව නැත | - |
| පිටබැද්දර නව සතිපොල පිහිටි ඉඩම (පර්චස් 10) | 200,000 | 2006.07.05 |
| පිටබැද්දර සති පොල භූමියේ පිහිටි රෝයල් සර්විස් ගොඩනැගිල්ල | සඳහන්ව නැත | |
| කළුබෝවිටියන නගරය පුළුල් කිරීම සඳහා මහවිට කුඹුර හෙවත් මහ ඕවිට කුඹුර (අක්කර 1, රූඩ 03, පර්.16) | | |
| මොරවක බස් නැවතුම් පොල ඉඩම (අක්කර 1, රූඩ.3, පර්චස් 10.59) | | 1998 |
| ගාල්ලෙ කුඹුර වත්ත නොහොත් කන්ඩම්බිගෙවත්ත (පර්.206) | | |
| දෙහිගස්පෙ තරුණ සේවා මාවත ඉඩම (පර්.13.46) | 220,000 | |
| | 420,000 | |

ඇමුණුම 02

| දිනය | වවුචර් අංකය | වැයවූ මුදල රු. | විස්තරය | හර කල වැය විෂය |
|---|---|---|---|---|
| 2012.04.17 | 312 | 37,575 | යකඩ වැට සවිකිරීම | 105 |
| 2012.04.23 | 320 | 156,030 | කාර්යාලයීය වැට සවිකිරිම | - |
| 2012.04.10 | 310 | 52,093 | ආරක්ෂිත වැඩ ඉදිකිරීම | 305 |
| 2012.04.30 | 344 | 65,400 | ප්‍රධාන ගේට්ටුව සවිකිරීම | 105 |
| 2012.04.05 | 345 | 46,050 | පයිප්ප මිලදී ගැනීම | 309 |
| 2012.02.09 | 102 | 6,000 | සතිපොල භූමියේ ගේට්ටුව සවිකිරීම | 305 |
| 2012.02.24 | 141 | 5,350 | -එම- | 309 |
| 2012.02.24 | 153 | 88,800 | -එම- | 309 |
| 2012.02.27 | 154 | 64,683 | -එම- | 305 |
| 2012.04.24 | 48 | 97,936 | නව ගොඩනාගඅල්ලට විදුලි ලබා ගැනීම | 705 |
| 2012.03.27 | 246 | 6,159 | පධාන ගේට්ටුව සඤහා වැලි මිලදී ගැනීම | 105 |
| 2012.04.09 | 305 | 70,000 | ගොඩනැගිල්ල පින්තාරු කිරිම සඳහා වැඩ කුලී | 305 |
| 2012.07.13 | 613 | 20,927 | ප්‍රාදේශීය සභාවේ තාප්පය සෑදීමට අවශ්‍යා ද්‍රව්‍ය මිලදී ගැනීම | 305 |
| 2012.03.19 | 45 | 30,352 | කොන්ක්‍රිට් කියුබ් සෑදීමට අදාල අච්චු මිලදී ගැනිම | |
| 2012.04.18 | 303 | 207,876 | ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල සඳහා තිරරෙදි මිලදී ගැනීම | |
| | | ---------- | | |
| | | 985,231 | | |
| | | ====== | | |